
අත්තම්මගේ
ඔවදන
ශ්‍රීපාලි දිනිති කුලරත්න

# අත්තම්මාගේ ඔවදන

ශ්‍රීපාලි දිනිති කුලරත්න

# අත්තම්මාගේ ඔවදන

## ශ්‍රීපාලී දිනිති කුලරත්න

කතෘ

<u>කතෘගේ වෙනත් කෘති</u>

බදුලු කෝච්චියෙන් එන්න

පාසල - බ/සීවලී විද්‍යාලය,
බණ්ඩාරවෙල

ඉගෙනුම ලබන පන්තිය - 5 ශ්‍රේණිය

කෘතිය පළ කරන දිනය - 2026/05/10

**ISBN 978-624-211-342-5**

# පිදුම

**කුඩා කළ සිට මට**

**කවි කතන්දර කියා දී**

**පොත් කියවීමට මෙන්ම**

**පොත් ලිවීමට ද**

**දිරිය දුන්**

**ආදරණීය අත්තම්මාට,**

**අම්මාට, අප්පච්චිට, අයියාට,**

**සහ**

**මාගේ පන්තිභාර දිනේෂ් ගුරු පියාණන්ට**

**මේ පොත පුදකර සිටිමි.**



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොතේ ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වූ ගුරුහවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව

**2026.05.10**

"අම්මේ මම ඔයට යනවා"

කියලා අයියා කියන කොට අම්මා

"හා හොඳයි පුතේ.

හැබැයි වැඩි වෙලාවක් ඉන්නේ නැතුව එන්න" කියලා කිවුවා.

"අනේ අම්මේ... මමත් ශමිදිලත් එක්ක නාලා එන්නද?"

මම අම්මගෙන් ඇහුවේ අයියටත් කලින් ඔයට දුවන්න. ගොඩක් බලාපොරොත්තු තියාගෙනයි. වතුරේ සෙල්ලම් කරන හැටි, වතුර ගහගන්න හැටි මට මැවිලා පෙණුනා.

"අනේ පුතේ... අද අපි ගෙදරින් නාමු. මට වෙලාවක් නෑ ඔයාව එක්කන් යන්න." කියලා අම්මා කිවුවා.

අම්මා එහෙම කියනකොට මට ගොඩක් දුක හිතුණා.

තවත් දවසක අපේ අයියා, එයාගේ යාළුවොත් එක්ක ලොකු සරුංගලයක් හැදුවා. අයියයි යාළුවෝ ටිකයි සරුංගල් යවන්න කන්දට ගියා.

දැන් සරුංගල් කාලේ නිසා අප්පච්චි මට සරුංගලයක් හදලා දීලා තිබ්බා. මම ඒකත් අරගෙන අයියලත් එක්ක යන්න හැදුවම අයියා කිව්වා

"නංගී ඔයා ගෑනු ළමයෙක්. ඔයා අපිත් එක්ක එන්න එපා" කියලා.

එතකොට මම අඬන්න පටන් ගත්තා. අයියා මාව ගණන් නොගෙන යන්න ගියා. ඊට පස්සේ මට හිතුණා,

"අපරාදේ මං ගෑනු ළමයෙක් වුණේ පිරිමි ළමයෙක් වුණා නම් මට අයියා වගේ ඕන දෙයක් කරන්න තිබ්බා. ගස් නගින්න, සරුංගල් යවන්න, සෙල්ලම් කරන්න වගේ තව දේවල් කරන්න තිබ්බා කියලා.

මේ ගැන මතක් වෙනකොට මට ගොඩක් දුක හිතුණා. ඒ කතාව අහගෙන හිටපු අත්තම්මා මගේ ළඟට ඇවිල්ලා මෙහෙම කිව්වා.

"ඔයා දුක්වෙන්න එපා. ඔයා හරිම වාසනාවන්තයි. ගැහැණු ළමයෙක් කියන්නේ ගෙදරට, රටට, ලෝකයට වටිනා සම්පතක්. අයියට වගේම ඔයාටත් ගොඩක් දේවල් කරන්න පුළුවන්" කියලා. එතකොට මට තවත් දුක හිතුණා.

"ඇයි අත්තම්මේ... අයියා කියනවා නංගී ඔයා ගෑනු ළමයෙක්, ගෑනු ළමයි ඕවා කරන්නේ නෑ" කියලා.

අම්මයි, අප්පච්චියි කියනවා "ඔයා තාම පොඩි වැඩියි" කියලා. ඒ නිසයි මට හිතුනේ අයියා වගේ වුණා නම් හොඳයි කියලා" මම කිව්වා.

"ඉස්සර කාලෙත් අපේ රට පාලනය කරපු රැජිණියන් හිටියා. අපේ රට බේර ගත්ත කුමාරිකාවොත් හිටියා. එහෙම අය අපේ රට, ජාතිය, ආගම එක එක කරදරවලින් බේරගන්න, ජීවිතය පරදුවට තියලා කටයුතු කළා. ඉතින් එයාලත් ඔයා වගේ හිතුවනම් එයාලට ඒ වගේ වීර ක්‍රියා කරන්න වෙන්නේ නෑ. ඉතින් ඔය කුමාරිකාවන්ගේ ලස්සන ආදර්ශමත් කතා ගොඩක් අපේ ඉතිහාස පොත්වල කියෙනවා. කියලා අත්තම්මා කිව්වා.



"අනේ අත්තම්මේ..., මට ඒ වගේ එක කතාවක් කියලා දෙන්නකෝ." මම අත්තම්මට ඇවිටිලි කළා.

"හා හොඳයි පුතේ රෑට නිදාගන්න කලින් මම ඒක ඔයාට කියලා දෙන්නම් කියලා." අත්තම්මා කිව්වා.

රෑ වුණු පසු අයියා පාඩම් කළා. අප්පච්චි රූපවාහිනිය බැලුවා. අම්මා කෑම ඉව්වා. අත්තම්මා ගුවන්විදුලියට සවන් දුන්නා. ඉතිං මෙහෙම ඉන්නකොට මම හිමින් ආත්තම්මා ළඟට ගියා. අර කතාව කියලා දෙන්න කියලා මම අත්තම්මාට මතක් කළා.

"කවුද අත්තම්මේ... අපේ ඉතිහාසයේ ඉන්න වීර කාන්තා චරිත?"මම ඇහුවා.

"විහාරමහා දේවිය මුහුද ගොඩගලන වෙලාවේ මුහුදට පැනලා රට බේරා ගත්තා. ලීලාවතී කියන බිසව අපේ රට 3න් වරක් පාලනය කරලා තියෙනවා. ඒ විතරක් ද? කළ්‍යාණවතී බිසව, චූලසීවලී බිසව වගේ අය අපේ රට පාලනය කරපු බිසෝවරු"එතකොට අත්තම්මා කුසුමාසන දේවිය රජ වෙලා හිටියේ නැද්ද?" මං ඇහුවා.

"නෑ පුතේ කුසුමාසන දේවිය කියන්නේ අපේ පළවැනි විමලධර්මසූරිය රජුගේ බිසව"

"ඉතිං අත්තම්මා හේමමාලා කුමරිය අපේ රටේ නෙවෙයිද?" කිසි දෙයක් නොදත් මං ඇහුවා.

"අන්න පුතා ඇහුවේ හොඳ ප්‍රශ්නයක්" කියලා අත්තම්මා කිව්වේ දිග කතාවකට මුල පුරමින්.

"අත්තම්මේ.... හේමමාලා කුමරිය විශේෂ වන්නේ ඇයි?" මම අත්තම්මගේ කතාවට බාධාවක් වගේ වෙමින් ඇහුවා.ඊට පස්සේ අත්තම්මා මෙහෙම කිව්වා.

"අ... මං පුතාට කියන්නම්කෝ හේමමාලා කුමරිය කියන්නේ කළිඟු රටේ රජතුමාගේ දියණිය. අපේ සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ වාම දන්ත ධාතූන් වහන්සේ තැන්පත් කර තිබුණේ කළිඟු රටේ. ඉතින් කාලයක් යද්දි මේ රජතුමාට යුද්ධයකට මුහුණ පාන්න සිද්ධ වෙනවා. ඊට පස්සේ රජතුමාට හිතෙනවා දන්ත ධාතූන් වහන්සේට කරදරයක් වුනොත් කියලා. රජතුමා එයාගේ දූ කුමරිය වන හේමමාලා කුමරියට කතා කරලා මෙහෙම කිව්වා "කුමරියනි දන්ත ධාතූන් වහන්සේ වඩාත් ආරක්ෂිත තැනක තැන්පත් කරන්න කාලේ ඇවිත් කියලා"



"ඉතින් එහෙම තමයි හේමමාලා කුමරියට අපේ රටට එන්න අවස්ථාව ලැබුණේ "කියලා.

"ඉතින් අත්තම්මා ඒ වගේ ලොකු වගකීමක් බාරගන්න හේමමාලා කුමරිය කැමති වුණාද? මං ඇහුවා."දෙමාපියන්ට කීකරු වන දරුවන් දෙමාපියන්ට ඇහුම්කන් දෙනවා.

මගේ පුතේ ඒ වගේ තමයි හේමමාලා කුමරියත් කියලා අත්තම්මා කිව්වා.

"අත්තම්මේ... දන්නේ නැති රටකට යන්න හේමමාලා කුමරිය බයවුණේ නැද්ද? "මං ඇහුවා. ඊට පස්සේ අත්තම්මා මෙහෙම කිව්වා"පුතේ හේමමාලා කුමරිය අභීත,ධෛර්යමත් කුමාරිකාවක්. ඉතිහාස පොත්වල තියෙන විදිහට හේමමාලා කුමරියටයි දන්ත කුමාරයාටයි අපේ රටට එන මුහුදු ගමනේදී බය හිතෙන දේවල ගොඩකට මුහුණපාන්න සිද්දවෙලා තියෙනවලු."

"ඒ මොනවද? අත්තම්මේ... ඒ" මං ඇහුවා.

"දන්ත ධාතූන් වහන්සේ අපේ රටට ගෙනාවේ කුමරිගේ කෙස් කළඹේ බොහොම ආරක්ෂිතව සඟවාගෙන".

ඊට පස්සේ හේමමාලා හා දන්ත කුමරු මහ මුහුදේ නැවකින් එනකොට මුහුදේ හිටපු නාගයෝ මුහුද දෙබෑ කරගෙන ඇවිත් දන්ත ධාතූන් වහන්සේට වන්දනා කරන්න පටන් ගත්තලු .ඉතින් එහෙම වෙලාවක කුමරියට කොච්චර බය හිතෙන්න ඇතිද? අත්තම්මා කිව්වා.

"අත්තම්මේ හේමමාලා කුමරිය අපේ රටට ආවට පස්සේ සිද්ධ වුණ දේවල් කොහෙද ලියවිලා තියෙන්නේ? මං ඇහුවා. ඊට පස්සේ අත්තම්මා මෙහෙම කිව්වා "පුතේ අර අම්මගේ පොත් රාක්කයේ තියෙන මහාවංශය, ධාතුවංශය, දළදාවංශය වගේ වංශ කතා පොත්වල ඔය ගැන ලස්සනට ලියවිලා තියෙනවා කියලා අත්තම්මා කිව්වා."

"අත්තම්මේ කුමරිය අපේ රටට ආවට පස්සේ අපේ රටේ හැටියට හැඩ ගැහුණේ කොහොමද?" මං අත්තම්මගෙන් ඇහුවා. අත්තම්මා ඒකට දුන්නේ නම් දිග උත්තරයක්. "පුතේ ලංකාවයි,ඉන්දියාවයි අතර දුර 32 කිලෝමීටර්යක් වුණාට මේ රටවල් දෙකේ තිබෙන ආහාර, භාෂාව, ආගම, සිරිත් විරිත්,සංස්කෘතිය මේ හැමෝම එකිනෙකට වෙනස්.



මං අත්තම්මගේ කතාවට බාධා කරා.

"හරි ආත්තම්මේ මට හරිම ප්‍රශ්නයක් කුමාරිකාව අපේ රටේ භාෂාව දනගත්තේ කොහොමද? කුමාරිකාව අපේ රට ගැන කලින් දනගෙන ඉදලා තියෙනවාද?"

මට ප්‍රශ්න ගොඩයි. ඒ ගැන දනගන්නකන් මට ඉවසිල්ලක් නෑ. අත්තම්මා කිසිම කලබලයක් නැතිව මගේ ප්‍රශ්න ඔක්කොම අහගෙන හිටියා. අන්තිමට අත්තම්මා මෙහෙම කිව්වා.

"පුතේ පුංචි ඔයාට ඔහොම ප්‍රශ්න ඇතිවෙන එක පුදුමයක් නෙමෙයි. මෙතනදී වැදගත් වෙන්නේ හේමමාලා කුමරියගේ අරමුණ. ඒ වගේම තමයි මගේ පුතත් ඔයාගේ අරමුණට යන්න හිතේ ධෛර්ය ඇති කරගන්න ඕනි. හොඳින් ඉගෙන ගන්න ඕනි. අපේ රටේ අපි ගරු කරන හැම කාන්තා චරිතෙකින්ම කියලා දෙන පාඩම තමයි ඒක. හේමමාලා කුමරියට උපහාර වෙන්න මේ ඔවදන හිතට අරගෙන වැඩ කළොත් මගේ පුතාටත් වරදින්නේ නෑ කියලා අත්තම්මා මාව තුරුළු කර ගත්තා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරු භවතුන්, දෙමාපියන්, ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම් (ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-211-342-5